ආරම්භය 1945-09-30 ලි.ප. අංකය:39/82
දෙහිවල,සුදර්ශන පාරේ,ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනයේ පිහිටි
දෙහිවල බෞද්ධෝදය සංගමය මගින්, ධර්මදානය පිණිස සෑම පුර පසළොස්වක පොහොය දිනයක් පාසා නිකුත් කරන මාසික දහම් කලාපය.

බෞද්ධෝදය

81 වර්ෂය - ශ්‍රී බු: ව 2570 2026 අගෝස්තු 27 නිකිණි කළාපය

ඓතිහාසික සිතුල්පව්ව රාජමහා විහාරය,
ඓතිහාසික යටගල රාජමහා විහාරය ප්‍රමුඛ අෂ්ඨ මහා විහාරාධිපති,
දක්ෂිණ ලංකාවේ සමථ බල සම්පන්න ප්‍රධාන අධිකරණ සංඝනායක
සද්ධර්ම කීර්ති ශ්‍රී රතනසාර,
කොළඹ නාලන්ද විද්‍යාලයේ හිටපු ධර්මාචාර්ය,
ශාස්ත්‍රපති, පූජ්‍ය, ලේල්වල සමිත ස්වාමීන්වහන්සේ

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

"මේ දහම ගැඹුරුය, අවබෝධය දුෂ්කරය"

"කිච්ඡේන මේ අධිගතං - හලං දානි පකාසිතුං
රාගදෝසපරේතේහී - නායං ධම්මෝ සුසම්බුධෝ
පටිසෝතගාමිං නිපුණං - ගම්භීරං දුද්දසං අණුං
රාගරත්තා න දක්ඛින්ති - තමොක්ඛන්ධේන ආවටා"

මා දුකසේ අවබෝධ කළ ධර්මය දෙසීම නිශ්ඵලයි. රාගද්වේෂයන්ගෙන් යුක්ත අයට අවබෝධ කිරීම අසීරුයි. රාගයෙන් රත් වුණු, මෝහයෙන් වෙළුණු අයට කෙලෙස් සැඩ පහරට විරුද්ධව යන, සියුම් වූ, පහසුවෙන් දැකීමට නොහැකි මේ ධර්මය නොවැටහේ.
(මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාසක, බෝධිරාජ කුමාර සූත්‍රය)

පෙරවස් නොවැසූ භික්ෂූන් වහන්සේලාගේ පසු වස් විසීමේ චාරිත්‍රය අදින් ආරම්භ වේ. වස් කාලය ගිහි පැවිදි දෙපක්ෂයම ධර්මාවබෝධය ලබන වකවානුවකි. බුදුහාමුදුරුවන් මේ ධර්මය අවබෝධ කර ගැනීමට කොතරම් වෙහෙසක් ගත්තාදැයි අරිය පරියේසන, බෝධිරාජ කුමාර, මහා සීහනාද, මහා සච්චක, සංගාරව,භයභේරව යන මජ්ඣිම නිකායට අයත් සූත්‍ර රාශියකම සඳහන් වේ.

භගු රට විසූ බෝධිරාජකුමාරයා එල්ලෙන නෙළුම් මලක හැඩය ඇති හෙයින් කෝකනද නම් වූ නව මැදුරක් ඉදිකරවා බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයා ලවා එය පළමුවෙන්ම පරිභෝග කරවීය. දන් පිරිනමා අවසන්වූ පසු බුදුහාමුදුරුවන් අසල මිටි අසුනක වාඩිවූ කුමාරයා මෙසේ කීය.

"ස්වාමිනි, සිරුරට සැප දී ලොව්තුරු සුවය ලද නොහැක. සිරුරට දුක් දීමෙන් පමණක් එය ලද හැකියි."

බුදුබව ලැබීමට පෙර තමන්ටත් ඔය විදියට සිතුන බවත් ඒ නිසා ගිහිගෙන් නික්ම ආළාරකාලාම, උද්දක රාමපුත්ත යන ගුරුවරුන් වෙත ගොස් ඔවුන්ගේ දහම් පරතෙරටම දැනගෙන එයින් නිවන ලද නොහැකි බවත්, බ්‍රහ්ම ලෝකයෙහි ඉපදීම පමණක් සිදුවන බවත් දැන ඒ දහම් හැර දමා කුසලය යනු කුමක්ද? සත්‍යය යනු කුමක්ද? කියා සොයමින් මගධයේ උරුවෙලා ජනපදයේ සේනානි නියම් ගමට පැමිණි බවත් බුදුහාමුදුරුවෝ කුමාරයාට විස්තර කළහ. එහි රමණීය පරිසරය ප්‍රධන් වීර්ය වඩන්නෙකුට සුදුසු බවත් තීරණය කළ සිදුහත් තවුසාණෝ එහිම නැවතුනහ.(නත්ථේව නිසීදිං)

බෝසත් තවුසාට එහිදී අපුරු උපමා තුනක් වැටහිණි.

i. අමු හෝ තෙත ලීයක් දමා තිබෙන්නේ ජලයේ නම් ගිනිගානා දණ්ඩෙන් කොපමණ ඇතිල්ලුවත් එයින් ගිනි නිපදවිය නොහැක. එ මෙන් වස්තුකාමයන්ගෙන් කය පිනවන, ක්ලේශ කාමයන්ගෙන් සිත පින වන කෙනෙකුට සත්‍යය අවබෝධ කළ නොහැකිය.

ii. ලී කැබැල්ල ගොඩබිමෙහි තිබුණත් එය තෙත හෝ අමු නම් එයින් ගිනි නිපදවිය නොහැකිය. එ මෙන් ගිහිගෙය අතහැර පැවිදි ජීවිතයට ආවත් ඔහුගේ සිතේ රාගාදී කෙලෙස් මතු වෙනවා නම්, කාමච්ඡන්ද ආදී පංච නීවරණ ධර්මයන්ගෙන් සිත වැසී ගොස් ඇතිනම් ඔහුටද සත්‍යාවබෝධය දුෂ්කරය.

iii. ලීය අමුත් නෑ, තෙතත් නෑ, ඒක දාලා තිබුණෙත් ගොඩබිමේ නම් පිටතවත්, ඇතුළතවත් තෙත් ගතියක් නැති ඒ ලීය ගිනිගානා දණ්ඩෙන් අතුල්ලා ගිනි නිපදවිය හැකිය. එමෙන් වස්තුකාමයෙන් වෙන්ව ක්ලේශ කාමයන් මැඩපවත්වන යෝගාවචරයෙකුට නීවරණ දුරු කර සත්‍යය අවබෝධ කළ හැකිය.

ඉන්පසු සිදුහත් තවුසා වස්තුකාමයන් තමා ළඟ නැති හෙයින් සිතේ පවතින ක්ලේශ කාමය දුරුකිරීමට එදා බොහෝ තවුසන් අනුගමනය කළ අත්තකිලමථානුයෝගය අනුගමනය කිරීමට යොමු විය.

පළමු කොටම දත් ඇඳි දෙක කිටිකිටියේ තද කරගෙන කුසල් සිතෙන් අකුසල් සිත පෙළන්නට උත්සාහ කළහ. එවිට කිසිලිවලින් අධික දහඩිය ගැලූ බවත්, කය නොසන්සුන් වූ බවත් බුදුහු කුමරාට පැහැදිලි කළහ. ඉන්පසු අප්‍රාණක ධ්‍යානය වැඩීමට යොමු වී මුඛය සහ නාසය තද කර ගත්හ. එවිට වාතය අධික ශබ්දයක් නගමින් කනෙන් පිටවිය. කන් දෙකෙහි ඇඟිලි ගසා ගෙන එය ද නතර කළ විට තියුණු කඩු තුඩකින් හිස් මුදුන සිදුරු කරන්නාක් මෙන් දැනිණි. සිහිය එළඹ සිටියත් කය නොසන්සුන් විය.තවදුරටත් එසේ භාවනා කරන විට ශරීර වාතය බඩට පිවිස තියුණු සැතකින් බඩ කපන්නාක් මෙන් දැනිණි. සිහිය දුර්වල

නොවුණත් කය දැවිලි සහිත විය. නොසන්සුන් විය. අඟුරු වලකට බලහත්කාරයෙන් ඇද දමන්නාක් මෙන් විය. එපමණ දුක් දුන්නත් ඉතා ස්වල්ප වූ හෝ උසස් ඤාණයක් උපදවා ගත නොහැකි විය. ආහාර නොගෙන සිටීම බැහැර කර උදු, මුං ආදිය තැම්බූ වතුර පතක් පමණ දිනකට ආහාර වශයෙන් ගැනීමට යොමු විය. ආහාර අඩුකම නිසා බෝසතුන්ගේ ශරීරය කෘශ විය. නිසීදන මාංශය ඔටුවකුගේ පා බඳු විය. දිරා ගිය ගෙයක පරාල මෙන් ඉළ ඇට මතු වී පෙනුණි. ඇස් යටට ගිලී තිබුණි. අමුවෙන් කඩා අව්වට දැමූ ලබුගෙඩියක් මෙන් හිසේ සම හැකුළුණි. බඩ පිටකොන්දට ඇළී ගියේය.

අත්තකිලමථානුයෝගයෙහි මීට වඩා වැඩි දුෂ්කර ක්‍රියාවෙක් නැත. මෙතරම් තද දුක් විඳිද්දත් මිනිස් බව ඉක්මවූ උසස් ඥානයක් ලබා ගැනීමට නොහැකි විය. සම්බෝධිය සඳහා වෙනත් මඟක් තිබිය යුතු යැයි කල්පනා කළ බෝසතාණන් වහන්සේට ළඳරු වියෙහි දඹගස මුල ආනාපානසතිය වඩා ප්‍රථම ධ්‍යානයට සම වැද සිටි අයුරු සිහි වී එය සම්බෝධියට මඟ විය හැකියයි සතානුසාරී විඤ්ඤාණය පහළ විය. පෙර අත්දැකීමක් ආශ්‍රයෙන් පහළවන අනුමාන ඥානයට සතානුසාරී විඤ්ඤාණ යයි කියනු ලැබේ.

දුර්වල කයකින් එය වැඩිය නොහැකි නිසා දළඅාහාර වළඳන්නට පටන් ගත් විට සිදුහත් තවුසා වීර්යය අත්හැර ඇතැයි කියමින් පස්වග තවුසෝ එතුමන් හැර දමා ගියහ. ක්‍රමයෙන් සතර වන ධ්‍යානය දක්වා සිත පුරුදු කරමින් ඒ නිශ්චල වූ, උපක්ලේශ දුරු වූ සිතින් පෙර විසූ කඳ පිළිවෙළ දකින නුවණ ප්‍රථම යාමේදී ලබාගත්හ. දෙවන යාමයේ දී සත්ත්වයන්ගේ චුති උප්පත්තිය දක්නා නුවණ ද, අලුයම් යාමයේ දී ආශ්‍රවයන් ක්ෂය කොට ලබන උතුම් වූ අරහත්වයද ලබාගත්හ.

තමා අවබෝධ කරගත් පටිච්චසමුප්පාද ධර්මය ගැඹුරු බැවින් රාගයෙන් රත් වූ මෝහයෙන් නුවණ වැසුණු අයට අවබෝධ කළ නොහැකිය. එය දේසනා කිරීමට යාමෙන් ඇතිවන්නේ වෙහෙසකියි බුදුරජාණන් වහන්සේ දහම් දෙසීමට මන්දෝත්සාහී වූහ. එය සාමාන්‍ය මිනිසුන් තුළ ඇතිවන කනගාටුව, කැළඹීම, තරහ වැනි සිතිවිලි නිසා හටගන්නා පසුබෑමක් නොව ධර්මයේ ගැඹුර සහ අසන්නාගේ නුවණ මඳ බව සලකා ප්‍රඥාවෙන් ඇතිකරගන්නා ස්වභාවයකි.

මේ සිතිවිල්ල දැනගත් සහම්පති මහා බ්‍රහ්මයා පැමිණ අවබෝධ කරගන්නන් ඇතිහෙයින් දහම් දෙසන්නැයි කළ ආරාධනාවත් ලෝක සත්ත්වයා කෙරෙහි පැවති මහා කරුණාවත් නිසා බුදු ඇසින් ලොව දෙස බැලූ විට ලෝකය පියුම් විලක් සේ පෙනිණි. විලෙහි මඩ ආශ්‍රිතව පවතින නෙළුම් පොහොට්ටු මෙන් දහම් දෙසීම මගින් මුදාගත නොහැකි අයද, ජලය හා සමව පවතින පොහොට්ටු මෙන් මඳක් වෙහෙස වී නිවන අවබෝධ කළ හැකි අයද, ජලයේ උඩට මතු වී ඇති පොහොට්ටු හිරු රැස් ලද විට පිපෙන්නාසේ දහම් අසා වහා තේරුම් ගත හැකි අයද දුටුවහ. මෙය ගුරුවරයෙකු තමාගෙන් ඉගෙනගන්නා සිසුන්ගේ හැකියාවන්, දැනුම් මට්ටම ගැන අවබෝධ කරගන්නවා වැනි ක්‍රියාවකි.

එසේ සිතා මුලින්ම දහම් දෙසීමට තම ගුරුවරුන් ජීවත්ව නැති හෙයින් තමන්ට බොහෝ උපකාරවත්ව සිටි පස්වග තවුසන් කරා ගොස් දම්සක් පැවතුම් සූත්‍ර දේශනාව වදාරා ඔවුන්

රහත් භාවයට පත්වීමට මහ හෙළි කොට දුන්හ. බුදුහිමියන් මේ විස්තරය වදාළ විට

"ස්වාමිනි, ඔබ වහන්සේ වැනි මහ පෙන්වන්නෙකු ලබන භික්ෂුව කොපමණ කලෙකින් රහත් ඵලය මේ ජීවිතයේදීම තමාගේ විශිෂ්ඨ ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කෙරේදැ?" යි බෝධිරාජකුමාරයා ඇසීය. ඊට පිළිතුරු වශයෙන් බුදුහිමියන් වදාළේ උපරිම වශයෙන් සත් වසරක් හා අවම වශයෙන් එක් දිනක් ඇතුළත ශ්‍රද්ධාව ඇති, නිරෝගී, කපටිකම නැති අවංක, කුසල් වැඩීමට හා අකුසල් ප්‍රහානයට යොමු වූ වීර්ය ඇති සංස්කාරයන්ගේ හට ගැනීම හා විනාශ වීම පිළිසිඳ දැකීමට සමත් නුවණින් යුක්ත භික්ෂුවකට ඒ අරහත් ඵලය ලබා ඊට පැමිණ වාසය කළ හැකි බවයි.

වේඛනස්ස සුත්‍රයේ දී කපටි නොවූ, සෘජු ගති ඇති බුද්ධිමත් පුරුෂයන් තමා වෙත එන්නේ නම් අවවාද අනුශාසනා කරන බවත් ඒ අනුව පිළිපදින ඔවුන්ට නොබෝ කලකින්ම අවිද්‍යා බන්ධනය බිඳ අර්හත්වය තමාටම ප්‍රත්‍යක්ෂ කළ හැකි බවත් වේඛනස්ස පිරිවැජියාට දේශනා කොට ඇත. (ම.නි.)දිනක් බුදුරදුන් භග්ග රටේ සුංසුමාර ගිරියෙහි භේසකලා වනයෙහි වැඩවසද්දී චේති ජනපදයේ පාචීනවංශ වනයෙහි බවුන් වැඩූ අනුරුද්ධ හිමියන්ට මෙසේ සිත්විය.

"මේ ධර්මය තියෙන්නේ අල්පේච්ඡ, ලද දෙයින් සතුටුවන, පිරිස සමග නොඇලුණු, පටන්ගත් වීර්ය ඇති, එළඹ සිටි සිහිය ඇති, එකඟ වූ සිත් ඇති, ප්‍රඥාවන්ත කෙනාට පමණි. බුදුහාමුදුරුවෝ අනුරුද්ධ හාමුදුරුවන්ගේ සිත දැනගෙන සාධුයෙන් එහි වැඩ ප්‍රශංසා කොට "මේ ධර්මය තිබෙන්නේ ප්‍රපංච රහිත වූ නිවනෙහි ඇලුණු තැනැත්තාටය"යි අටවන කරුණක් ද එකතු කළහ.(අ.නි. අට්ඨක නිපාත ගහපතිවග්ග, අනුරුද්ධ සුත්‍රය)

ඔබත් විමුක්තිය ලැබීමට කැමතිනම් මෙම ප්‍රතිපදාවට අදම යොමු වන්න. තෙරුවන් සරණයි.